# ඇබෑර්තු

# ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

### මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සහ කිවුල් ඔය සංවර්ධන ව්‍යාපෘතිය

### (මාදුරු ඔය ව්‍යාපෘති කාලය 2026-2032, කිවුල් ඔය ව්‍යාපෘති කාලය 2026-2031)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 02/2026 දරන චක්‍රලේඛයට සහ අදාළ රජයේ බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුකූලව, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සහ කිවුල් ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පූර්ණ කාලීන කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත්, කැපවීමෙන් කටයුතු කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
සෑම තනතුරකටම අදාළ වැටුප MSD අංක 02/2026 දරන 2026.03.28 දිනැති චක්‍රලේඛයේ II වන ඇමුණුමේ 02 වන තීරුවේ දක්වා ඇති අතර, මූලික සුදුසුකම් සහ පළපුරුදු අවශ්‍යතා I වන ඇමුණුමේ 02 වන තීරුවේ දක්වා ඇත.

සහායක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025, MSD චක්‍රලේඛ අංක 02/2026 සහ අනෙකුත් අදාළ රජයේ බඳවා ගැනීමේ පටිපාටීන් අදාළ වේ.

**ඇබෑර්තු විස්තර**

| අංකය | විස්තරය / සේවා ස්ථානය | වැටුප් මට්ටම | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය – වැලිකන්ද | • MSD චක්‍රලේඛ අංක 02/2026<br>• සහායක කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 | 33 |
| 02 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය – කිවුල් ඔය (එල් කලාපය) | | 41 |
| 03 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය – වැලිකන්ද | | 42 |

**සාමාන්‍ය කොන්දේසි**

- ✓ අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, රජයේ රීති සහ රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය අවශ්‍යතා වේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල පූර්ව පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.
- ✓ දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් යොමු කළ යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා:**

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ (MASL) නිල වෙබ් අඩවියට පිවිසෙන්න - https://mahaweli.gov.lk/
- දුරකථන අංක:- 0112 695972 / 0112 689743

(ඉහත සඳහන් කළ චක්‍රලේඛ ලබා ගැනීම සඳහා කරුණාකර මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න)

- ✓ අයදුම්පත් 2026.10.29 දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් යොමු කළ යුතුය. අයදුම් කරන තනතුර කවරයේ ඉහළ වම්පස කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,**
**නො. 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**

කෙටි ලයිස්තුවකට ඇතුලත් කළ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. කුමන හෝ ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසු වීමට හේතු වන අතර, එවැනි ක්‍රියාවන්හි නිරත වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

Gazette.lk